# ස්ටැටින් (Statin) ඖෂධීය භූමිකාව කොලෙස්ටරෝල් (Cholesterol) වලින් ඔබ්බට...

කොලෙස්ටරෝල් අඩු කරන ඖෂධයක් ලෙස ස්ටැටින් (statin) භාවිතය සාර්ථකත්වයට පැමිණ ඇති බව දැන් තහවුරුවී ඇත. නූතන පර්යේෂණ අනුව ස්ටැටින් (statin) භාවිතය මොළයේ හටගන්නා ඇල්ෂයිමර් (ALZHEIMER'S) රෝගී තත්ත්වයන්ට, මොළයේ ස්නායු සම්බන්ධ මල්ටිපල් ස්කෙලරෝසියාව (MULTIPLE SCLEROSIS) වැනි රෝගී තත්ත්වයන්ට පමණක් නොව අස්ථි දිරායාමේ (OSTEOPORPSIS) රෝගී තත්ත්වයන්ටද සාර්ථකව යොදා ගත හැකි වෙතැයි පෙනී ගොස් ඇත. එය කිරීටක ධමනි සම්බන්ධ රෝගී තත්ත්වයන් (CORONARY ARTERY DISEASE) මහාධමනි කපාටයන් (අඩ සඳ කපාට) සම්බන්ධ රෝගී තත්ත්වයන්ට (AORTIC – VALVE DISEASE) සාර්ථකව පිළියම් කරන ආකාරයටම පිළිකා (CANCER) සඳහා ද යොදාගත හැකිවෙනු ඇතැයි බලාපොරොත්තු ලියලා ඇත.




## ඇල්ෂයිමර් (ALZHEIMER'S) රෝගී තත්ත්වයන්

ඇල්ෂයිමර් (Alzheimer's) රෝගී තත්ත්වයක් පෙන්වන ප්‍රධාන සාධකයක් වන්නේ මොළයේ පටකවල ඇමිලොයිඩ් ප්‍රෝටීනය බැඳීමයි. ස්ටැටින් (statin) මගින් එම ප්‍රෝටීනය සැදීම වළක්වන්නේ එම ප්‍රෝටීනය සෑදීමට උපකාරී වන කොලෙස්ටරෝල් ස්ටැටින් (statin) මගින් අඩුකරන බැවිනි.



ස්ටැටින් (statin) භාවිතා කරන්නන් අතර ඇල්ෂයිමර් (Alzheimer's) රෝගී තත්ත්වයන්ට ගොදුරුවීමේ අවධානම 39% කින් පමණ අඩු වී ඇති බව සොයාගෙන ඇත.

## මහාධමනි කපාටයන් (අඩසඳ කපාටයන්) සම්බන්ධ රෝගී තත්ත්වයන් (AORTIC – VALVE DISEASE)



මහා ධමනි කපාටයන් (අඩ සඳ කපාට) ඛණකම්වීම නිසා හෘදය අකරණියන් (heart failure) ඇතිවිය හැකිය. ස්ටැටින් (sratin) සැත්කම්වලින් තොරව රෝගී තත්ත්වයන් සුවපත් කිරීමට උපකාරී වේ.

කරන ලද පර්යේෂණයකදී හෙළිවූයේ මහාධමනි කපාට සම්බන්ධ රෝගී තත්ත්වයන් 50% කින් පමණ අඩුකරලීමට ස්ටැටින් (statin) සමත්ව ඇති බවයි.

## කිරීටක ධමනි සම්බන්ධයෙන් රෝගී තත්ත්වයන් (CORONARY ARTERY DISEASE)

ස්ටැටින් මගින් ප්‍රතිකාර කරන ප්‍රධාන ඉලක්කගත රෝගී තත්ත්වයකි. රුධිරයේ පවත්නා කොලොස්ටරෝල් ප්‍රමාණය අඩු කිරීමෙන් රුධිරවාහිනී පිරිසිදු කරනු ලබයි.

මෙවැනි ආබාධයන්ට ගොදුරුවීමේ දැඩි ප්‍රවණතා ඇති රෝගීන් 20000 ක් පමණ යොදාගෙන කරනු ලැබූ පර්යේෂණයකදී අනාවරණය වූයේ එමගින් ඉතා අවම වශයෙන් හෘදයාබාධ (heart attack) සහ ආඝාතයන් (stroke) 25%කින් පමණවත් අඩුවී ඇති බවයි.



## අස්ථි බිඳීම (BONE FRACTURES)

මූෂික වර්ගයට අයත් ලෑටි ගැන සතුන් යොදාගෙන කරන ලද පර්යේෂණ අනුව අනාවරණය වූවේ ස්ටැටින් (statin) මගින් උනුන්ගේ අස්ථි ගොඩගැන්වීම වර්ධනය කළ බවයි.



මෙම ප්‍රතිලාභය මානවයා කෙරෙහ යොදාගත හැකිවේ නම් ස්ටැටින් (statin) මගින් අස්ථි දිරායෑමේ (osteoporosis) රෝගී තත්ත්වයන්ට භාවිතා කළ හැකි නව්‍ය ප්‍රතිකාර ක්‍රමයක් ආදේශ කර ගත හැකිවනු ඇත. එනම් අස්ථි දිරායාම වළක්වා ගැනීමේ ප්‍රතිකාර වෙනුවට අස්ථි වර්ධනය කිරීමේ ප්‍රතිකාර විධි සපැමිණෙනු ඇත.

## මල්ටිපල් ස්කෙලරෝසියාව (MULTIPLE SCLEROSIS)


ස්ටැටින් (statin) මගින් මල්ටිපල් ස්කෙලරෝසියානු (MS) තත්ත්වයන් වැඩිදියුණුවීම වළක්වන්නේ ශරීරයේ ස්වයං ප්‍රතිශක්තිකරණයේ ආබාධකාරීත්වයන් ම ත නහර පටකවලට සිදුකරනු ලබන හානීන් වැළැක්වීමෙන් ය.



ස්ටැටින් (statin) මගින් මොළයට සිදුවන හානිකර තත්ත්වයන 40% කින් පමණ අඩුකරලීමට හැකිවන බව පර්යේෂණයකදී සොයාගෙන ඇත. එහෙත් එමගින් අකර්මණ්‍යතාවන් මුළුමනින්ම වළක්වාගැනීමට සමත්වේද යන්න පැවසීමට නම් තවත් මඳ කලක් ගතවෙනු ඇත.

විස්තර 54 පිටුවේ.

ස්ටැටින් අමෙරිකා එක්සත් ජනපදය තුළ වැඩියෙන්ම අලෙවි වන ඖෂධයයි. වයෝවෘධ ජනගහනය වැඩිවීම සහ පර්යේෂකයින් විසින් විවිධ රෝග සුවකිරීමේලා ස්ටැටින් සතු විභව ගුණය ගවේෂණය කිරීමේ හේතුවෙන් එම ඖෂධ වර්ගය සඳහා වන ඉල්ලුම ඉහළ යා හැකිය.




Saman Malalasekera